# ‘අබා’ - ජාතික හීනමානයක කියැවීමක් වශයෙන්

- ගාමිණී වියන්ගොඩ (රාවය)

% මිනීමැරීම සඳහා ඉතිහාසය සේවයට කැඳවීම ඓතිහාසික ය. දුටුගැමුණු රජු තමන් විසින් දහස් ගණන් මිනිසුන් ඝාතනය කරනු ලැබුවේ ය යන සිත් තැවුලෙන් කල් ගෙවන සඳ, ඔහු විසින් ඝාතනය කොට ඇත්තේ මිනිස් ප්‍රාණීන් එක හමාරක් පමණකි යි, මහාවංශ කතුවරයා (බෞද්ධ භික්ෂුවක්) රහතුන් ලවා කියැවී ය. එම පාඩම ම, එ නම්, “යුද්ධයේ ජයග්‍රහණය සඳහා කෙරෙන මිනිස් ඝාතනය දෙවියන් ගෙන් වුව සමාව ලබන” බව ජැක්සන් ඇන්තනි නැවත අපට කියා දෙයි.

මහාවංශ කතුවරයා සහ ජැක්සන් ඇන්තනි අතර මේ කාරණය අරභයා ඇත්තේ එක වෙනසකි. මහානාම හිමියන් මිනිස් ඝාතනය සඳහා ‘සමාව’ දානය කෙළේ, ‘තිසරණ සහ පන්සිල්’ දායක කරගෙන ය. (දුටුගැමුණු අතින් යුද්ධයේ දී මියගිය එක ඇත්තෙක්, පන්සිල් සමාදන් වී සිටියේ ලු. අනික් ඇත්තා, තෙරුවන් සරණ ගොස් සිටියේ ලු. පන්සිල් සඳහා ලකුණු එක යි. තිසරණ සඳහා ලකුණු බාගය යි.) ජැක්සන් ඒ සමාව ප්‍රදානය කරන්නේ දෙවියන් හරහා ය. කෙ සේ වෙතත්, අපට වැදගත් වන්නේ කවුරුන් සහ කුමක් ලවා කරවන්නේ ද යන්න නො ව, ඒ කරවන්නේ කුමක් ද යන්න යි. එ නම්, මිනීමැරීම යි. (ජැක්සන් ගේ මේ ඉතිහාස හේතු පාඨය කොළඹ හමුදා මූලස්ථාන නාම පුවරුවේත්, කිලිනොච්චියේ එල්.ටී.ටී.ඊ. මූලස්ථාන නාම පුවරුවේත් අලවනු නැතැ යි, තිසරණ පංච ශීලයේ නාමයෙනුත්, දෙවියන් ගේ නාමයෙනුත් ඉල්ලා සිටීම වටී).

සෑම ජාතියක ම ඉතිහාසය, වර්තමානයේ සිට බලන විට නෑකම් කියන්නේ ම්ලේච්ඡත්වයට ය. එය අස්වාභාවික නැත. එහෙත් එම ම්ලේච්ඡත්වයම වර්තමානයටත් අනුගත කර ගැනීමට යත්න දැරීම අසාමාන්‍ය නො වෙනවා පමණක් නො ව, සාපරාධී ද වන්නේ ය. මේ ම්ලේච්ඡත්වය විද්‍යාත්මක ඉතිහාස විවරණයක ආවේශයෙන් වර්තමානයේ ඉඩමකට අයිතිය පෑම සඳහා ඉදිරිපත් කෙරෙන විට, ඉතිහාසය සහ ප්‍රබන්ධකරණය අතර පාදා ගත යුතු වෙනස, පුරාණෝක්ති අර්ථයෙන් පමණක් නො ව, වර්තමාන ඇට-මස්-ලේ අර්ථයෙන් ද මැකී යයි. ඉතිහාසය ප්‍රබන්ධයක් වන්නේ, අතීතය පිළිබඳ ස්මරණ ගැබේ පෝෂණය වෙද්දී සිදු වූ ගබ්සා වීම් නිසා පමණක් ම නො වේ. ඉතිහාසඥයා තමන් ජීවත් වන තත්කාලීන සමාජ අවශ්‍යතා විසින් ආසක්ත ප්‍රබන්ධයක

සිරකරුවෙකු ද කෙරෙන නිසා ය.

සිංහලේ ආරම්භය ගැන මුල් ම ලිඛිත ඉතිහාසය සංගෘහිත කෙරෙන දීපවංශය ලියැවෙන්නේ, විජයාගමනයෙන් අඩු වශයෙන් වසර 800 වත් ඇවෑමෙන් ය. අද අප භාවිත කරන වංශකතාව, ඊටත් අවුරුදු 200 කට පසු ව ලියන ලද මහාවංශය යි. මේ සා දීර්ඝ කාලයක් මේ ඉතිහාසය " සංරක්ෂණය" වී තිබුණේ දීපවංශය හෝ මහාවංශය ලියූ ලේඛකයන් ගේ හිස තුළ නො ව, ඔවුන් ජීවත් වූ තත් සමාජයේ පොදු (අ)මතකය තුළ යි. නූතන ඉතිහාසය විද්‍යාවක් වශයෙන් සැළකෙන්නේ, අතීතය කියැවීම මෙකී ලිඛිත (අ)මතකයේ වචන 'තුළින්' වෙනුවට, එම (අ)මතකයේ පේළි 'අතරින්' කියැවීමට ගන්නා උත්සාහය නිසා ය.

චිත්‍රපටියට අදාළ උදාහරණයක් මෙ සේ ය: බුදුන් ප්‍රථමයෙන් ලංකාවට වැඩම කළ අවස්ථාවේ මෙහි වාසය කළ යක්ෂයන් ව ගිරිකුලකට පලවා හැරිය බව කියන මහානාම හිමියෝ, ලංකාවට ගොඩබසින විජයට මුලින් මුණගස්වන්නේ ද යක්ෂ ගෝත්‍රික කුමාරිකාවක් වූ කුවේණිය ව ය. විජය ගේ පැමිණීම සිදු වන්නේ බුදුන් ගේ වැඩම කිරීමෙන් වසර කිහිපයකට පසු ව ය. කොහේ දෝ ගිරිකුලකට බුදුන් විසින් පලවා හැරිය යක්ෂයන් (මේ ගිරිකුල ඇත්තේ අල්ලපු වැටේ නෙවෙයි නම්) මේ කෙටි කාලය තුළ විජයට මුණගැසීම සිදු විය හැක්කේ, එක්කෝ බුදුන් ගේ පැමිණීම සහ යකුන් පළවා හැරීම ප්‍රබන්ධයක් වන නිසා ය. නැත් නම්, විජය ගේ පැමිණීම සහ කුවේණිය මුණගැසීම ප්‍රබන්ධයක් වන නිසා ය. එ සේත් නැත් නම් මේ දෙක ම ප්‍රබන්ධයන් වන නිසා ය. ඒ කෙ සේ වෙතත්, මේ සිදුවීම් දෙක, එක විට 'ඉතිහාසය' විය නො හැකි බව පැහැදිළි ය. ලිඛිත ඉතිහාසය වුව, ව්‍යුහාත්මක කියැවීම් හරහා විමර්ශනාත්මක පුරාවිද්‍යාවක් කර ගන්නවා වෙනුවට උදේ රෑ දුම් අල්ලන ජාතික උප්පැන්න සහතිකයක් කර ගත යුතු නැති බව එහි අදහස යි.

සිනමා කෘතියක් වශයෙන් 'අබා' සාමාන්‍ය නිෂ්පාදනයකි. විශාල වියදමක් දරා ඇති නිසා දැවැන්ත නිෂ්පාදනයක් විය හැක. එහෙත් එය වීර කාව්‍යයක් නො වේ. හේතුව, හබරා හැරුණු විට වෙන කිසි වීරයෙකු චිත පටියේ දී අපට හමු නො වීම යි. උන්මාද චිත්‍රා ප්‍රකට වන්නේ අමරණීය ප්‍රේමය සඳහා වුවත්, සිනමාකරුවා මේ කෘතිය තුළ ඇය ව විෂය කරගෙන ඇත්තේ ඓතිහාසික ජාතික විමර්ශනයකට බැවින් මේ චිත්‍රපටිය සැළකිය හැක්කේ දෘෂ්ටිවාදාත්මක ව්‍යාපෘතියක් වශයෙනි. සැබෑ යුද පරිසරයක් ඇතුළේ මෙය නිෂ්පාදනය වීමත්, ඊට රාජ්‍ය අනුග්‍රහය නොමද

ව ලැබීමත් සැලකිල්ලට ගත් කල එය වඩාත් තහවුරු වෙයි. එහෙත් රජය වෙනුවෙන් සහ සිංහලයන් වෙනුවෙන් මේ චිත්‍රපටිය නරඹා රජයටත්, සිංහලයාටත් මෙය රෙකමදාරු කරන ලොක්කන්ට ලොකු වැරදීමක් සිදු ව ඇති බව පෙනේ. කලාවෙහි ප්‍රස්තුතය සැබෑවක් විය යුතු නැත. එහෙත් සැබෑවක් වශයෙන් ප්‍රස්තුතගත කෙරෙන විෂයයක් වෙයි නම් එය පාරභෞතික විය නො හැක.

ජැක්සන් කලාකරුවෙකු නිසා, විභේදිත පෞරුෂයක් සහිත පුරවැසියෙකු වීමට බර වැඩි ය. ඔහු සිංහලයෙකි. එහෙත් සිංහලේ වංශකතාව යනු 'සිංහල-බෞද්ධයා' ගේ වංශකතාව මිස තනිකර සිංහලයෙකු ගේ ඉතිහාසයක් නො වෙති යි ලංකාවේ බෞද්ධයෝ කියති. බෞද්ධයෙකු නො වන සිංහලයෙකු වේ ද, ඔහු මේ අර්බුදය තුළ අසිංහලයෙකු වන්නේ ය. මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට ජැක්සන් ඇන්තනි ගත් උත්සාහයේ ප්‍රතිඵලයකි, 'අබා'.

ශක්‍ර දේවේන්ද්‍රයා විසින් හඳේ හාවා ඇඳපු කතාව, (සස ජාතකය) 1969 දී නීල් ආම්ස්ට්‍රෝං හඳට ගොඩබැස්ස දා සිට අපේ ස්වාමීන් වහන්සේලා ධර්ම දේශනා සඳහා නිමිති කර නො ගනිති. විද්‍යාවෙන් පුරාණෝක්ති ලිහන්නේ එ ලෙස ය. විජය ගේ කතාව ප්‍රෞඪත්වයක් වශයෙන් ගත් ජාතියක්, නූතනත්වයට පා තබද්දී එම පෞඪත්වයේ නිමිත්ත ලජ්ජාවට කාරණයක් බව වටහා ගැනීම ස්වභාවික ය. විජය ගේ ආච්චී සිංහයෙකු සමග සහවාසයේ යෙදීම තිරිසන් භාවිතයකි. එය පශු මෛථුනය වශයෙන් හැඳින්වේ. ඉන් උපදින දරු දෙ දෙනා ගෙන් පිරිමි දරුවා (සිංහබාහු) සිංහයා ව ඝාතනය කරයි. මෙය පිතෘ ඝාතනයකි. ඉන් පසු අයියා සහවාසයට ගන්නේ සිය එක් කුස උපන් නංගී ව ය. එය ව්‍යභිචාරය වශයෙන් හැඳින් වේ. විජය යනු මේ විකෘතිතා සියල්ලේ මිශ්‍රණයෙන් උපන් දරුවා ය. ජැක්සන් ඇන්තනි පැවත එන්නේ ඔහුගෙන් යැයි මහානාම හිමියෝ ලියා ඇත.

සස ජාතකය අතහැරියා සේ මේ "විජය ජාතකයත්" බැහැර කිරීමේ ශිෂ්ටාචාරගත ප්‍රණෝදයක් 21 වැනි සිය වසේ නූතන මිනිසා (ජැක්සන් ඇන්තනි) තුළ ඇති වීම ගරු කටයුතු ය. ඒ පැටිකිරිය වෙනස් කර ගැනීමේ අවස්ථා දෙකක් මේ කියන කාලයේ දී ගැහැනුන් හරහා සැපයුණි. එක ගැහැනියක් කුවේණිය යි. එහෙත් ඇගෙන් වැඩ ගෙන ඇය ව කැළයට පන්නා දැමූ නිසා ඒ අවස්ථාව ව්‍යර්ථ විය. ඊ ළඟ ගැහැනිය උන්මාද චිත්‍රා ය. 'අබා' යනු ඇගේ පුතා ය. ඇගේ රහස් පෙම්වතා

දීඝගාමිණී ය. ඔහු බුදුන් වහන්සේට ලේ නෑකම් ඇත්තෙකි. එ විට, විජය ගෙන් සිංහල වන අප, දීඝගාමිණී ගෙන් බුදුන් වහන්සේට නෑයෝ වෙමු. විජය ලංකාවට ගොඩබසින දවස සහ බුදුන් පිරිනිවන් පාන දවස එකක් ම වීමත්, පිරිනිවන් මංචකයේ සිටි බුදුන් වහන්සේ ලංකාව සහ විජය ඇතුළු පිරිස ආරක්ෂා කරන්නැ යි ශක්‍රයාට පැවරීමේ ප්‍රවාදයත් සමග පැහෙන්නේ උන්මාද චිත්‍රා සහ දීඝගාමිණී සහවාසයෙන් පණ්ඩුකාභය බිහි වීමේ ඓතිහාසික කතාව යි. එ විට අප, නිකං ම සිංහලයන් නො ව, 'සිංහල-බෞද්ධයන්' ය. මෙය ප්‍රබන්ධයක් මිස ඉතිහාසය නො වන බව අමුතුවෙන් කිව යුතු නැත.

කතෝලික භාවය රැකගෙන සිංහලයෙකු වීමට අවශ්‍ය ජැක්සන් කරන්නේ, මේ ප්‍රබන්ධය තවත් ප්‍රබන්ධයකින් අතික්‍රමණය කිරීම යි. දීඝගාමිණී වෙනුවට (බුදුන් විසින් පිටමං කරනු ලැබූ) චිත්තරාජ නැමැති යක්ෂ ගෝත්‍රිකයා 'අබා' ගේ පියා වශයෙන් නාමකරණය වන්නේ ඒ සඳහා ය. අබා උපදින අවස්ථාවේ තිඹිරිගෙට එන දීඝ ගාමිණී ඉන් පසු කො තැනක දී වත් චිත්‍රපටයේ දී අපට හමු නො වේ.

එක පැත්තකින් ජැක්සන්, සිංහලයන් වන අප වෙනුවෙන් අපේ වංශකතාවේ අශිෂ්ඨත්වය (පශු මෛථුනය, පීතෘ ඝාතනය, ව්‍යභිචාරය) ශුද්ධ කර දෙයි. ඒ, චිත්තරාජ හරහා අප ව, අඩු වශයෙන් එ තැන් පටන් වත්, විජය ගෙන් නිදහස් කොට යක්ෂයින් ගෙන් පැවත එන්නන් වශයෙන් භෞතීස්ම කිරීමෙනි. ඒ සමග ම, දීඝ ගාමිණී හරහා බුද්ධාගමට තිබූ ලේ ඥාතිත්වයත් ඉබේම අහෝසි කෙරේ. ඉතිහාසයේ ප්‍රබන්ධකරුවා කෙළේ දරුවා මාරු කිරීම ය. නූතන ප්‍රබන්ධකරුවා පියා ව ද මාරු කරයි. එහි ඇති වරද කිම?

එහෙත්, "දිවි පරදුවට තබා මව්බිම බේරා ගමි" යැයි අබා කියන්නේ, කාගෙන් මව්බිම බේරා ගැනීමක් ගැන ද? චිත්‍රපටිය අපට කියා දෙන ආකාරයට, අබා ගේ මාමාවරුන් ගෙන් ය. මේ මාමාවරු යනු, විජය ගේ මල්ලී ගේ දරුවන් ය. එ නම්, විජය ගේ ලේ ඇති "ආර්ය සිංහලයන්" ය. මේ අනුව බලන විට, වික්‍රමබාහු කරුණාරත්න කියන කාරණය ඇත්ත විය හැක. ඔහුට අනුව, චිත්තරාජ යනු දෙමළ ය.